අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
'இசுருபாய', பத்தரமுல்ல, இலங்கை.
'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 +94112784846
isurupaya@moe.gov.lk www.moe.gov.lk

මගේ අංකය / எனது இல. / My Ref. ED/1/27/15/01/2022 — ඔබේ අංකය / உமது இல. / Your Ref. — දිනය / திகதி / Date 2022.04.5

සියලුම ජාතික පාසල් විදුහල්පතිවරුන් වෙත,

**<u>2022 ජාතික පාසල් ගුරු ස්ථාන මාරු ක්‍රියාත්මක කිරීම</u>**

01. වාර්ෂික ගුරු ස්ථාන මාරු 2022 යටතේ ජාතික පාසල් වල ගුරුභවතුන්ගේ ස්ථාන මාරු සඳහා මාර්ගගත ක්‍රමවේදයට අයදුම්පත් කැඳවීමට අධ්‍යාපන අමාත්‍යාංශය තීරණය කර ඇත. මෙම අවස්ථාවේ ඉහත සඳහන් ක්‍රමවේදය ඔස්සේ ගුරු ස්ථාන මාරු වීම ක්‍රියාත්මක කිරීමට අදාළව පහත උපදෙස් සංග්‍රහය පිළිබඳ අවධානය යොමු කළ යුතුය. ඒ අනුව, මෙම ස්ථාන මාරුවීම ප්‍රධාන කාණ්ඩ 02කින් සමන්විත වේ.

**1.1 <u>පළමු කාණ්ඩය</u>**

<u>දැනට සිටින ජාතික පාසලේ සේවා කාලය වර්ෂ 10 සම්පූර්ණ කළ ගුරුභවතුන් සඳහා ක්‍රියාත්මක කරනු ලබන අනිවාර්ය ස්ථාන මාරු.</u>

- <u>2021.12.31 දිනට හෝ ඊට පෙර දැනට සේවය කරන පාසලේ සේවා කාලය වර්ෂ 10 සම්පූර්ණ කරන ගුරුභවතුන් වාර්ෂික ස්ථාන මාරු ක්‍රියාවලියට අනිවාර්යයෙන් ම යටත් වේ. එම ගුරුභවතුන් සියලු දෙනාම https://nstt.moe.gov.lk දිගුව ඔස්සේ මාර්ගගතව ගුරු ස්ථාන මාරු අයදුම්පත යොමු කර එහි මුද්‍රිත පිටපතක් ලබා ගෙන එය විදුහල්පති වෙත භාර දිය යුතුය.</u> **මාර්ගගතව අයදුම්පත් යොමු කළ හැකි කාලසීමාව 2022/04/17 දින සිට 2022/04/30 දින දක්වා වේ.**

- පෞද්ගලික අවශ්‍යතාවයන් හේතුවෙන් ලබාගත් තාවකාලික අනුයුක්තවීම, පෞද්ගලික අවශ්‍යතා හේතුවෙන් ලබාගත් දේශීය/ විදේශීය වැටුප් සහිත/ රහිත නිවාඩු ආදිය ද වැටුප් ලබන පාසලේ සේවාකාලයට ඇතුළත් ලෙස ගණන් බලනු ලැබේ.

- **සේවා කාලය වර්ෂ 10 සම්පූර්ණ කළ සියලුම ගුරුභවතුන්ගේ සම්පූර්ණ කරන ලද <u>ස්ථාන මාරු සඳහා වන අයදුම්පත් සමඟ ගුරුභවතුන්ගේ නාමලේඛනය මේ සමඟ ඇති TTB/2022 ආකෘතියේ සඳහන් කළ යුතුය.</u>**

- **<u>වර්ෂ 10 සේවාකාලය සම්පූර්ණ වීම හේතුවෙන් ස්ථාන මාරු ලැබීමට යටත් වුවද කිසියම් ගුරුභවතෙක් නියමිත දිනට අදාළ අයදුම්පත්‍රය සම්පූර්ණ කර විදුහල්පතිවරයාට භාර නොදෙන්නේ නම් TTB/10/2022 උපලේඛනයෙහි ඔවුන්ගේ නම් හා විදුහල්පති නිර්දේශය ඇතුළත් කර එවිය යුතුය. මෙම තොරතුරු මත එම ගුරුභවතුන් හට ස්ථාන මාරු ලබා දීම ගුරු මාරු මණ්ඩලය විසින් සිදු කරනු ලැබේ.</u>**

**1.2 <u>දෙවන කාණ්ඩය - වාර්ෂික ස්ථාන මාරු</u>**

- පළමු කාණ්ඩයට එනම් <u>අනිවාර්ය ස්ථාන මාරුවීම් වලට යටත් නොවන එකම පාසලේ සේවාකාලය වසර 10 ට අඩු ගුරුභවතුන්ට</u> ද තම ස්ථාන මාරු ඉල්ලීම් ඉදිරිපත් කළ හැකිය. එම ගුරුභවතුන් ද https://nstt.moe.gov.lk දිගුව ඔස්සේ අයදුම්පත මාර්ගගතව සම්පූර්ණ කර යොමු කළ යුතුය. එහි මුද්‍රිත පිටපතක් ලබාගෙන විදුහල්පති වෙත භාර දිය යුතුය. **මාර්ගගතව අයදුම්පත් යොමු කළ හැකි කාලසීමාව 2022/04/17 දින සිට 2022/04/30 දින දක්වා වේ.**

- එම සියලු අයදුම්පත් ගුරුභවතුන්ගේ නාමලේඛනය **<u>TTB/2022</u>** ආකෘතියේ සඳහන් කළ යුතුය.

- මාර්ගගතව යොමු කළ ගුරු ස්ථාන මාරු අයදුම්පත හැරුණු විට වෙනත් ආකෘති මගින් හෝ පුද්ගලිකව අයදුම්පත් අමාත්‍යාංශයට නොඑවීමට, විදුහල්පතිවරුන් විසින් වගබලාගත යුතු වේ.

**02.** ගුරු ස්ථාන මාරු අයදුම්පත් අධ්‍යාපන අමාත්‍යාංශය වෙත යොමු කිරීමේ දී විදුහල්පතිවරුන් විසින් පහත උපදෙස් ප්‍රකාරව කටයුතු කළ යුතු වේ.

1. අයදුම්පත් එවිය යුතු අවසාන දිනට පෙර මාර්ගගතව අයදුම්පත් යොමු කිරීමට ගුරුභවතුන් දැනුවත් කිරීම හා අන්තර්ජාල පරිගණක පහසුකම් ලබා දීම හා තමා විසින්ම මුද්‍රිත පිටපත අත්සන් කර විදුහල්පති වෙත භාර දිය යුතු බවට දැනුවත් කළ යුතුය.

2. ස්ථාන මාරු ඉල්ලීම් සඳහා වන අයදුම්පත් එවීමේ දී උපදෙස් පත්‍රිකාවේ සඳහන් කර ඇති අතිරේක ලියවිලි වන;

(i) ගුරුවරයාගේ පත්වීම් ලිපියේ විදුහල්පති සහතික කළ පිටපත,
(ii) වර්තමාන සේවා ස්ථානයට ස්ථාන මාරු ලැබූ ලිපියේ විදුහල්පති සහතික කළ පිටපත,
(iii) ඉගැන්වීම් කරන කාලසටහනේ විදුහල්පති සහතික කළ පිටපත,

අමුණා ඇති බවට තහවුරු කරගෙන අයදුම්පත් අමාත්‍යාංශයට එවීමට විදුහල්පතිවරුන් විසින් වග බලා ගත යුතුය.

**03.** විදුහල්පති විසින් වසර 10 සම්පූර්ණ කළ ගුරුභවතුන්ගේ හා වාර්ෂික ස්ථාන මාරු අයදුම් කරන සෙසු ගුරුභවතුන්ගේ තම අත්සන යෙදා විදුහල්පති වෙත ඉදිරිපත් කළ අයදුම්පත් හි විදුහල්පති විසින් සම්පූර්ණ කළ යුතු කොටස් පැහැදිලිව සම්පූර්ණ කර උපලේඛනය ද සමඟ එකවර අධ්‍යාපන අමාත්‍යාංශයට එවිය යුතුය.

**04.** විදුහල්පතිවරුන් විසින් සම්පූර්ණ කර අයදුම්පත් සමඟ එවිය යුතු උපලේඛන.

(i) **TTB/2022** උපලේඛනය - අයදුම්පත් යොමු කරනු ලබන සියලුම ගුරුභවතුන්ගේ තොරතුරු ඇතුළත් කළ යුතුය. ඔවුන් තම පාසලේ 2021.12.31 දිනට සේවා කාලය, විශ්‍රාම ගන්නා දිනය, දැනට නිවාඩු ලබා ඇත්නම් ඒ කුමක් සඳහාද යන්න, ප්‍රාථමික අංශයේ උගන්වන ගුරුභවතෙකු නම් උගන්වන ශ්‍රේණිය පැහැදිලිව ඇතුළත් කළ යුතුය.

(ii) **TTB/10/2022** උපලේඛනය - තම පාසලේ සේවය කරනු ලබන වසර 10ට වැඩි සේවා කාලයක් සහිත අයදුම්පත් යොමු කළ හා නොකළ සියලුම ගුරුභවතුන්ගේ නම, 2021.12.31 දිනට තම පාසලේ සේවා කාලය හා තම නිර්දේශය පැහැදිලිව ඇතුළත් කර එවිය යුතුය. විදුහල්පති නිර්දේශය මත අයදුම්පත් යොමු නොකළ ගුරුභවතුන්හටද ස්ථාන මාරු මණ්ඩලය මගින් ස්ථාන මාරු ලබා දෙනු ඇත.

**05.** 2022 ගුරු ස්ථාන මාරු සම්බන්ධව **ගුරුභවතුන් සඳහා වන උපදෙස් සංග්‍රහය** මේ සමග එවනු ලබන අතර, එය ඔබ පාසලේ දැන්වීම් පුවරුවේ ප්‍රදර්ශනය කළ යුතුය. **(මේ පිළිබඳව ගුරු මණ්ඩලය දැනුවත් කර ලොග් සටහනක් තැබිය යුතුය. )**

**06.** සියලු අයදුම්පත් 2022/05/20 දිනට පෙර අධ්‍යාපන අධ්‍යක්ෂ, ජාතික පාසල් ගුරු ස්ථාන මාරු ශාඛාව, පළමු මහල, අධ්‍යාපන අමාත්‍යාංශය, ඉසුරුපාය, පැලවත්ත, බත්තරමුල්ල යන ලිපිනයට යොමු කළ යුතු අතර අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය වන **2022/05/20 දිනට පසුව ලබා දෙන අයදුම්පත් පිළිබඳව ඇතිවන ගැටළු සඳහා විදුහල්පති වගකිව යුතු වේ.**

**07.** යම් ගුරු භවතෙකු පළාත් පාසල් ඉල්ලුම් කරන්නේ නම්, අයදුම්පත් කට්ටල 04ක් ඉදිරිපත් කළ යුතුය.

**08.** ඉහත කරුණු සම්බන්ධයෙන් යම් ගැටළුවක් පවතී නම් 011-2784434 දුරකතන අංකයට හෝ director.tt@emis.moe.gov.lk ඊ මේල් ලිපිනය ඔස්සේ දැනුම් දිය හැක.

**මහාචාර්ය කේ. කපිල සී.කේ. පෙරේරා**
**ලේකම්**
අධ්‍යාපන අමාත්‍යාංශය


ගරු අමාත්‍යතුමා / கௌரவ அமைச்சர் / Hon. Minister — +94112784832, +94112784825, minister.education@moe.gov.lk

ලේකම් / செயலாளர் / Secretary — +94112784811, +94112785162, secretary.education@moe.gov.lk